# බුද්ධ ධර්මය

## 2 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 30 පාඩම
# ථූපාරාම දාගැබ නමදිමු

මෙම පාඩමෙන් ඔබේ දරුවාට ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථානයක් පිළිබඳව හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ.

## ථූපාරාම දාගැබ නමදිමු



❖ මෙම කවිය ගායනා කරන්න.

ගල් කණු වටකොට ඇත්තේ
මහමෙවුනා වන වන උයනේ
ථූපාරාම සෑ රඳුනේ
සාධු සාධු නමදින්නේ

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෘ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

❖ මෙම වැකි කියවන්න.

- මේ තියෙන්නේ ථූපාරාම දාගැබයි.
- අනුරාධපුරයේ සෑදූ පළමු දාගැබ ථූපාරාමයයි.
- ථූපාරාම දාගැබ ඉදිකරවූයේ දේවානම්පියතිස්ස රජතුමා විසිනුයි.
- බුදු රජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන් කර ඇත්තේ ද ථූපාරාම දාගැබේ ය.

❖ ගැළපෙන සේ යා කරන්න.

| | |
|---|---|
| 1. ථූපාරාම දාගැබ | දේවානම්පිය තිස්ස රජතුමා |
| 2. දාගැබේ නිදන් කර ඇත්තේ | ථූපාරාම දාගැබයි |
| 3. ථූපාරාමය කරවූයේ | අනුරාධපුරයේ පිහිටා ඇත. |
| 4. අනුරාධපුරයේ පළමු දාගැබ | දකුණු අකු ධාතූන් වහන්සේ |

❖ පදම් කල මැටි යොදා ගෙන ථූපාරාම වෙහෙර නිර්මාණය කරන්න.

❖ සෑදූ වෙහෙර සුදු පාට සව් කඩදාසි කැබලි ඉරා අලවා හැඩ කරන්න.

**ඉතාමත් හොඳයි.**

දෙමව්පියනි,වැඩිහිටියනි/

දුෂ්කරතා දැක්වුවහොත් පමණක් උදවු කරන්න.


අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.



Copyright © www.e-thaksalawa.moe.gov.lk